# ප්‍රධාන පක්ෂ රට පෙරට ගෙනයන ආර්ථික සැලැස්ම ජනතාව හමුවේ තැබිය යුතුයි

## හිටපු ඇමැති මිලින්ද මොරගොඩ කියයි

**රට ඉදිරියට ගෙන යන ආර්ථික සැලැස්ම දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් ජනතාව හමුවේ තැබිය යුතු බව මිලින්ද යෝජනා කරයි.**

ප්‍රචාරය හා පුද්ගල ප්‍රතිරූප ප්‍රවර්ධනය මහ ඉහළින් කරගෙන යන නමුත් පශ්චාත් කොවිඩ් අභියෝග පරාජය කර මෙරට ආර්ථිකය නඟා සිටුවීමේ අරමුණෙන් දර්ශනයක් සහිත වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීමට මහ මැතිවරණයට ඉදිරිපත් වී සිටින අපේක්ෂකයන් හෝ දේශපාලන පක්ෂ අසමත්වීම අවාසනාවක් බව පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ හිටපු අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.

බිල් ක්ලින්ටන් ජනාධිපතිවරණයට තරග කරන අවස්ථාවේ දී ඔහුගේ දේශපාලන උපාය සකස් කළ ජේම්ස් කාවිල් මහතා ආර්ථික වැඩපිළිවෙළ හැර අනෙක් කිසිම දෙයක් ගැන අවධානය යොමු කිරීම පලක් නැති බව දැක්වූ අතර, එම අදහස අදටත් වලංගු බව මොරගොඩ මහතා අවධාරණය කරයි.

සීමිත සම්පත් ප්‍රමාණයක් සහිත කුඩා වෙළෙඳපොළක් වන ශ්‍රී ලංකාවට ජාත්‍යන්තරයෙන් හුදෙකලාවී පැවැතිය නොහැකිය. තනි ගමනක් නැත. පක්ෂ දේශපාලනඥයන් මැතිවරණ වේදිකාවේදී පලක් නැති වැඩ පිළිවෙළ ගැන කරුණු දක්වන අතර ආර්ථිකය ගැන අවබෝධයක් හා හැඟීමක් රහිතව රට හුදෙකලා කරන යෝජනා ඉදිරිපත් කරමින් සිටින බවද හෙතෙම පෙන්වා දෙයි.

ලෝකයේ සෑම රටක්ම මෙම සියවසේ විශාලම ආර්ථික අර්බුදය අභිමුවෙහි සිටින බව අමතක කළ යුතු නැත. කොවිඩ්-19 වසංගතය පාලනය කරගැනීමට ජනාධිපතිවරයා සාර්ථකව නායකත්වය දී තිබේ. නිශ්චිත ප්‍රතිකාර සොයා ගන්නා තෙක් අවදානම තුරන් නොවන අතර රට විවෘත වන සෑම අවස්ථාවකම තත්ත්වය වෙනස් විය හැකි බවද මොරගොඩ මහතා දක්වයි.

වසංගතය පාලනය කරගත හැකි තත්ත්වයක් තුළ දෙවැනි රැල්ලකට ඉඩ නොතබා, ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කර ලෝකයේ අනෙක් රටවලට ඉදිරියෙන් සිටිය හැකි තැනට පත් කිරීම විශාල අභියෝගයක් බව දක්වන මිලින්ද මොරගොඩ මහතා අපේක්ෂකයන් හා ප්‍රධාන දේශපාලන පක්ෂ රට ඉදිරියට ගෙන යන ආර්ථික සැලැස්ම ජනතාව හමුවේ තැබිය යුතු බවද කියා සිටී.

පක්ෂ ඉදිරිපත් කරන සාර්ථක වැඩපිළිවෙළ අනුව ජනතාව ඡන්දය පාවිච්චි කරනු ඇති අතර, එය පවතින අනතුරුදායක ආර්ථික ව්‍යුහය සාර්ථකව යහපත් පැත්තට හරවන්නට හේතුවනු ඇති බවද හෙතෙම සිය නිවේදනයෙහි දක්වයි.